# දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය

# ඇබෑර්තු

කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුරප්පාඩු ව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරාලූ පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. කළමනාකරණ සහකාර තනතුර (III ශ්‍රේණිය)**

**සුදුසුකම් :**

1. එක් වරකදී විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය පහත සඳහන් විෂයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව සමත්වී තිබිය යුතුය.
    - සිංහල භාෂාව / දෙමළ භාෂාව
    - ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍යය
    - ගණිතය

සහ

02. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සියලුම විෂයන් එක් වරකදී සමත්වී තිබිය යුතුය. (පැරණි නිර්දේශය යටතේ විෂයන් 3 ක් එක් වරකදී සමත්වීම මේ සඳහා ප්‍රමාණවත් වේ.)

03. පහත සුදුසුකම් සහිත අය සඳහා ප්‍රමුඛතාවය හිමිවේ.

අ) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස හයකට (06) නොඅඩු කාලසීමාවක පරිගණක යෙදවුම් පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක් තිබීම.

සහ

ආ) පරිගණක යෙදවුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක (02) පළපුරුද්ද.

**යෝග්‍යතා :**

අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

ආ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

ඇ) යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

**වැටුප් පරිමාණය :** 2025.01.01 දිනට මසකට රු. 49,475 – 17X540 – රු. 58,655
[U – MN 1 (III)]
(රජය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා ගෙවනු ලැබේ)

**තේරීමේ ක්‍රමය :** ලිඛිත පරීක්ෂණය (75% ලකුණු) සහ සම්මුඛ පරීක්ෂණය (25% ලකුණු) මගින්.

- සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂා දැනුම
- බුද්ධි පරීක්ෂණය සහ සාමාන්‍ය දැනුම
- පරිගණක සාක්ෂරතාව

**02. වැඩ සහායක තනතුර (III ශ්‍රේණිය)**

**සුදුසුකම් :**

1. අවස්ථා දෙකකට නොවැඩි ගණනකදී අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබිය යුතුය.

**වැටුප් පරිමාණය :** 2025.01.01 දිනට මසකට රු. 42,775 – 16X450 – රු. 49,975
[U PL 1(III)]
(රජය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනා ගෙවනු ලැබේ)

**තේරීමේ ක්‍රමය :** වෘත්තීය පරීක්ෂණයක් සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**වයස :** වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වෙනත් :**

**සෑම අයදුම්කරුවෙකුම,**

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- තනතුරේ කර්තව්‍යයන් මනාව ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

මේ සඳහා වන අයදුම්පත් 2026.10.05 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, බාහිර රෝගී අංශ ගොඩනැගිල්ල (OPD), 5 වන මහල, ජාතික ආයුර්වේද රෝහල, කෝට්ටේ පාර, බොරැල්ල, කොළඹ 08** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. කවරයේ ඉහළ වම්පස කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කරගන්න.

සෑම අයදුම්කරුවෙකුම අයදුම් කරන **සෑම තනතුරක් සඳහාම ආපසු ගෙවනු නොලබන අයදුම්පත් සැකසුම් ගාස්තුව ලෙස රු. 1,000/- ක මුදලක් ගෙවිය යුතුය.** එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ගාස්තු ගෙවිය යුතුය.

අයදුම්පත සහ වැඩිදුර තොරතුරු දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වෙබ් අඩවියෙන් **(https://pgiimed.cmb.ac.lk)** ලබා ගත හැක. නියමිත ආකෘතියෙන් ඉදිරිපත් කරන අයදුම්පත් පමණක් සලකා බලනු ලැබේ.

අසම්පූර්ණ අයදුම්පත් හෝ ගෙවීම් පත්‍රිකාව, සුදුසුකම් සහ පළපුරුද්ද සනාථ කරන සහතිකවල ඡායා පිටපත් ඇතුළුව අවශ්‍ය තොරතුරු අඩංගු නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබෙන අතර ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් කිසිදු හේතුවක් මත නැවත සලකා බලනු නොලැබේ.

තෝරාගනු ලබන අපේක්ෂකයින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සහ විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් ක්‍රමයේ සාමාජිකයෙකු බවට පත්වනු ඇත. ඔහු/ඇය සිය මාසික වැටුපෙන් 10% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට දායක කරනු ලබන අතර, ඒ සමගම සේව්‍යා විසින් සේවක වැටුපෙන් 15% කට සමාන මුදලක් දායක කරනු ලබයි. එයින් 8% ක් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලටත්, 7% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලටත් බැර කෙරේ. සේවක භාරකාර අරමුදල් විධිවිධානවලට අනුව විශ්වවිද්‍යාලය විසින් වැටුපෙන් සියයට තුනක් (3%) සේවක භාරකාර අරමුදලට දායක කරනු ඇත.

**අයදුම්පත් සැකසුම් ගාස්තු ගෙවීම** : අයදුම්කරුවන් අයදුම්පත ඉදිරිපත් කිරීමට පෙර පහත සඳහන් බැංකු ගිණුමට අදාළ ගෙවීම් සිදුකර, ගෙවීම් පත්‍රිකාවේ යොමුව ලෙස තමන්ගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ "Post of Management Assistant Gr III" / "Post of Works Aide Gr III" යනුවෙන් සටහන් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

මුල් බැංකු ගෙවීම් පත්‍රිකාව අයදුම්පතෙහි දී ඇති අදාළ කොටුවේ ඇලවිය යුතුය. අමුණා නොමැති මුල් බැංකු ගෙවීම් පත්‍රිකා හෝ අයදුම්කරුගේ තොරතුරු නොමැති බැංකු ගෙවීම් පත්‍රිකා භාරගනු නොලැබෙන බව කරුණාවෙන් සලකන්න. ගෙවීම් සත්‍යාපනය සඳහා ගෙවීම් පත්‍රිකාවේ ස්කෑන් කරන ලද පිටපතක් හෝ පැහැදිලි ඡායාරූපයක් recruitments@pgiimed.cmb.ac.lk වෙත විද්‍යුත් තැපැලෙන් එවිය යුතුය.

**ගිණුම් නාමය** : Postgraduate Institute of Indigenous Medicine | **ගිණුම් අංකය** : 92027342 |
**බැංකුව** : ලංකා බැංකුව | **ශාඛාව** : බොරැල්ල අධිශ්‍රේණි ශාඛාව .

රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා සහ/හෝ වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියා මාර්ගයෙන් යොමු කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් යොමු නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අධ්‍යක්ෂ**
**දේශීය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය**
**කෝට්ටේ පාර, බොරැල්ල, කොළඹ 08.**
**2026.09.13**

Gazette.lk